ලෙෆ් තෝල්ස්තෝයි

සිංහයා සහ බලු පැටියා

ලෙෆ් තෝල්ස්තෝයි

සිංහයා සහ බලු පැටියා

චිත්‍ර
වී. දවිදග්

පරිවර්තනය
දැදිගම වී. රුද්රිගු

Kanol



සිංහයා සහ බලුපැටියා

ලන්ඩන් නගරයේ මිනිසුන්ට වන සතුන් පෙන්වන සිරිතක් තිබුණා. සතුන් බලන අය මුදල් ගෙවන්න ඕන. නැතිනම් සතුන්ට කෑමට පුංචි බල්ලන් සහ පූසන් ගෙනැවිත් දෙන්න ඕන.

එක මිනිහෙක් වන සතුන් බලන්න හිතුවා. ඔහු පාරේ හිටිය බලු පැටියකු අල්ලාගෙන සත්තු වත්තට ගෙනාවා. ඔහුට වන සතුන් බැලීමට අවසර ලැබුණා. බලු පැටියාව සිංහයාට කෑමට කූඩුවට දැම්මා.

බලු පැටියා වලිගය හංගාගෙන සිංහ කූඩුවේ මුල්ලකට වෙලා හිටියා. සිංහයා උගේ ළඟට ගිහින් ඉව අල්ලා බැලුවා.

බලු පැටියා උඩුබැලි අතට පෙරළිලා පා උස්සලා වලිගය වැනුවා.

සිංහයා එක් පයකින් බලු පැටියාව අනෙක් පැත්තට පෙරලුවා.

බලු පැටියා පස්සා ගාත්වලින් හිට ගත්තා.

සිංහයා ඔලුව හරව හරවා බලු පැටියා දිහා බැලුවා, නමුත් ඌට හිරිහැර කළේ නැහැ.

සත්තු වත්ත අයිතිකාරයා සිංහයාට කෑමට මස් කැල්ලක් දැම්මා. ඌ පුංචි මස් කැල්ලක් බලු පැටියාට වෙන් කළා.

රෑ සිංහයා නින්දට ගියාට පස්සෙ බලු පැටියා සිංහයගෙ කකුලට ඔලුව තියලා නිදා ගත්තා.

එදා සිට සිංහයා සමග බලු පැටියා එකම කූඩුවේ වාසය කළා. සිංහයා ඌට හිරිහැර කළේ නැහැ. ඌ කෑම කෑවා. බල්ලාට ළං වී නිදා ගත්තා. සමහර දවස්වල දී බලු පැටියා සමග සෙල්ලම් කළා.





දවසක් දා එක් මහත්මයෙක් සත්තු වත්තට ඇවිත් තමාගේ බලු පැටියාව හඳුනා ගත්තා. බලු පැටියා තමාගේ හන්දා උඟව බාරදෙන ලෙස ඔහු ඉල්ලා හිටියා. අයිතිකාරයා බලු පැටියාට කතා කළ හැටියේ ම, සිංහයා බෙල්ලේ කේසර කෙළින් කරගෙන ගොරවන්නට පටන් ගත්තා.

ඉතින් ඔය විදිහට සිංහයයි බලු පැටියයි එකම කූඩුවක අවුරුද්දක් තිස්සේ ම ජීවත් වුණා.

ඊට අවුරුද්දකට පස්සේ බලු පැටියා ලෙඩ වෙලා මළා. සිංහයා කෑම කන්නේ නැතිව බලු පැටියාගේ මළකුණ ඉව කරන්න පටන් ගත්තා. ලෙවකන්න පටන් ගත්තා. ඉස්සරහ පාවලින් සොලවා බැලුවා.

බලු පැටියා මළා කියලා තේරුණායින් පස්සේ සිංහයා බෙල්ලේ කේසර කෙළින් කරගෙන වලිගය වනමින් ගොරවන්නට වුණා. ඌ කූඩුවේ යකඩ පොලු හපමින් බිම පෙරලුණා.

මුළු දවස තිස්සේ ම ගොරව ගොරවා ඌ කූඩුව ඇතුළෙ ඇවිදලා, බලු පැටියාගේ මළකුණ ළඟට වෙලා වැටිලා හිටියා. අයිතිකාරයා බලුකුණ එළියට ගන්න ළං වෙන්න හදනකොට, සිංහයා ඒකට ඉඩ දුන්නේ නැහැ.

තවත් බලු පැටියකු සිංහයා ළඟට දැම්මොත් උගේ කනගාටුව නැතිවෙයි කියලා හිතපු අයිතිකාරයා බලු පැටියකුව හොයා ගෙනැවිත් කූඩුවට දැම්මා. සිංහයා එක පාරට ම පැනලා ඒ බලු පැටියාව කෑලිවලට ඉරලා දැම්මා. පසුව බලු පැටියාගේ මළකුණ ළඟට වෙලා දවස් පහක් තිස්සේ වැතිරිලා හිටියා.

හයවෙනි දවසේ දී සිංහයාත් මළා.

රාජාලියා

මහ පාරක් අසළ ලොකු ගහක කූඩුවක් හදාගත් රාජාලියෙක් පැටවු ගැහැව්වා. මේ කූඩුව තිබුණේ මුහුදෙන් බොහොම ඈත.

ගහ අසළ මිනිසුන් කීපදෙනෙක් වැඩ කරමින් ඉන්නකොට රාජාලි අම්මා මුහුදෙන් ලොකු මාළුවකු ඩැහැගෙන පැටව් ළඟට ආවා. මාළුවා දුටු මිනිස්සු ගහ වටකරගෙන කෑ ගහන්නයි, රාජාලියාට ගල් ගහන්නයි පටන් ගත්තා. රාජාලියා මාළුවා බිම දැම්මා. මිනිස්සු මාළුවා අරගෙන ගියා.

රාජාලියා කූඩුව අයිනෙ වහලා හිටියා. රාජාලි පැටව් කෑම ඉල්ලා කෑ ගහන්න පටන් ගත්තා.



රාජාලියාට බොහොම මහන්සි හන්දා ආයෙමත් මුහුදට පියාඹා යන්න ශක්තිය තිබුණේ නැහැ. ඌ තම පැටවු පියාපත්වලින් වහගෙන හුරතල් කළා. උන්ගේ පිහාටු හොටෙන් පිස දැම්මා. ටිකක් ඉවසන්න කියලා රාජාලි අම්මා පැටවුන්ගෙන් ඉල්ලා හිටියා වගේ. පැටවුන්ව වැඩියෙන් හුරතල් කළ තරමට උන් කෑම ඉල්ලා කෑ ගැසුවා.

එතකොට රාජාලි අම්මා ඉහළ අත්තකට පියාඹා ගියා.

පැටවු වැඩියෙන් කෑ ගහන්න පටන් ගත්තා.

රාජාලි අම්මා මහ හයියෙන් හඬනගා පියාපත් වනලා මුහුදු දෙසට පියාඹා ගියා.

හවස ඇඳිරි වැටුණායින් පසු රාජාලි අම්මා සෙමින්, සෙමින් පහළින් පියාඹා ආවා. ඌ ආවේ ලොකු මාළුවකු ඩැහැගෙනයි.

ගහ ළඟට ආ රාජාලි අම්මා වට පිට බැලුවා මිනිසුන් නැතිද කියලා දැනගන්න. ඉක්මනට ඌ කූඩුව අයිනෙ වැහුවා.

රාජාලි පැටව් කටවල් ඇරලා කෑම ඉල්ලුවා. රාජාලි අම්මා මාළුවා කෑලිවලට ඉරලා පැටවුන්ට බෙදා දුන්නා.



ලෙෆ් තෝල්ස්තෝයි

සිංහයා සහ බලු පැටියා

චිත්‍ර
වී. දවිදෆ්

පරිවර්තනය
දැදිගම වී. රුද්රිගු

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-73-7

ප්‍රකාශනය
කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
යස ඉසුරු ප්‍රින්ටර්ස්

ප්‍රථම මුද්‍රණය 2018

















Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-73-7

kanolbooks.blogspot.com

Rs. 150/-